ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2025-02-17

| | | |
|---|---|---|
| පැමිණිලිකාර පාර්ශවය | : | පූජ්‍ය එස්. ශිවරාමක්‍රිෂ්නන් මයා,<br>නො. 20 සී, ෆසල්ස් ලේන්,<br>කොළඹ 06. |
| අගතියට පත් පාර්ශවය | : | සුගතීෂ් සිවරාමක්‍රිෂ්නන් මයා,<br>නො. 20 සී, ෆසල්ස් ලේන්,<br>කොළඹ 06. |
| වගඋත්තරකාර පාර්ශවය | 01 | උ.පො..ප. තෙවරප්පෙරුම මයා,<br>පොලිස් ස්ථානය,<br>වැල්ලවත්ත. |
| | 02 | පො.කො. 93968 සමරතුංග මයා,<br>පොලිස් ස්ථානය,<br>වැල්ලවත්ත. |
| | 03 | පො.කො. 84947 ගයාන් මයා,<br>පොලිස් ස්ථානය,<br>වැල්ලවත්ත. |
| | 04 | ඉෂාන් උදය කුමාර මයා,<br>උප පොලිස් පරීක්ෂක,<br>පොලිස් ස්ථානය,<br>වැල්ලවත්ත. |
| | 05 | සුභාෂ් මංජුල කහඳවල මයා,<br>ස්ථානාධිපති,<br>පොලිස් ස්ථානය,<br>වැල්ලවත්ත. |



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**පැමිණිලි අංකය : එච්ආර්සී/361/24**

**පැමිණිල්ල**

ඉහත නම සඳහන් පැමිණිලිකරු මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ සිය පැමිණිල්ල මගින් සඳහන් කර ඇත්තේ 2024.01.20 වන දින පැමිණිලිකරු පූජාවක් අවසන් කිරීමෙන් අනතුරුව කතරගම සිට පෙ.ව. 11.40 ට පමණ නිවසට පැමිණ පූජාව සඳහා රැගෙන යන ලද බඩු භාණ්ඩ ආදිය වාහනයෙන් බැහැර කරමින් සිටියදී නිවස ඉදිරිපිට ඇති Oneway ලෙස භාවිතා කරන මාර්ගයක් වන පසල්ස් ලේන් හි ලියාපදිංචි අංක ABV 1656 අංක දරණ නිල් පැහැති ත්‍රීවිල් රථයකින් පැමිණි පුද්ගලයින් අසභ්‍ය වචනවලින් බැන වදින ලද බවයි. පසුව තමාගේ පුතා විසින් එසේ අසභ්‍ය වචනවලින් බැණ වැදීමට හේතු විමසන ලද බවත් එම අවස්ථාවේ එකී ත්‍රීරෝද රථයෙන් පැමිණි නොහඳුනන පුද්ගලයින් 4 දෙනා විසින් පුතාට පහරදී ත්‍රීරෝද රථයට දමාගෙන ඔවුන්ගේ නිවස පිහිටා තිබෙන අංක 20 සී, පසල්ස් ලේන්, කොළඹ 06 සිට වැල්ලවත්ත පොලීසියට රැගෙන ගිය බවත් ඔවුන් වැල්ලවත්ත පොලීසියේ නිලධාරීන් බව පසුව හඳුනාගත් බවත්, එම අවස්ථාවේ දී එම ස්ථානයේ සිටි අනෙකුත් පුද්ගයින් ද මෙම සිද්ධිය දුටු බවත් CCTV සාක්ෂි ද තිබෙන බවත් සඳහන් කර ඇත. මෙම සිද්ධියට අදාළව වැල්ලවත්ත පොලීසියේ ස්ථානාධිපති වෙත පැමිණිලි කිරීමෙන් අනතුරුව මෙම සිද්ධියට සම්බන්ධ වූ පොලිස් නිලධාරීන් සියලු දෙනාම සමාව ඉල්ලූ බවත්, CCTV දර්ශන මගින් එය සනාථ කරගත හැකි බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත. (එකී CCTV දර්ශන පිටපත් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.)

පහරදීමට ලක් වූ පැමිණිලිකරුගේ පුතාට තුවාල වූ බවත් දෙතොල් හා නාසයෙන් ලේ පැමිණි බවත් ඒ සඳහා ප්‍රතිකාර ලබා ගත් බවත් කියා සිටී. මෙම සිදුවීම ඔහුට, ඔහුගේ පුතා සහ ඇසින් දුටු පුද්ගලයින්ට ද ඉතා අප්‍රසන්න සිදුවීමක් වූ අතර, සමාජය තුළ තමාගේ වැඩ කටයුතු සීමා වූ අතර, ස්වාධීනව කටයුතු කරමින් සිටි පුතාගේ ක්‍රියාකාරකම් ද සීමාවූ බවත් ශ්‍රී ලංකා පොලීසිය කෙරෙහි තිබූ විශ්වාසය ද අහිමිවී ඇති බව සඳහන් කර ඇත.

රටේ නීතිය ආරක්ෂා කිරීමට වගකීම දරණ මෙවැනි ආයතනයක් විසින් නීතිය කඩ කරමින් පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුවේ නම් එවැනි ආයතනයක් විශ්වාස කරන්නේ කෙසේද? ආරක්ෂාව ලබන්නේ කෙසේද? යනුවෙන් පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කර ඇත.

තවද, පැමිණිලිකරු පූජකවරයෙකු බැවින් අදාළ නිලධාරීන්ට සමාව ලබාදීමට එකග බවත් තම සමාජය තුළදී තමාගේ ගෞරවයට හානියක් සිදු නොවන සේ, තම පුතාගේ අනාගතයට (පිටරට අධ්‍යාපන කටයුතු, රැකියාව) මෙම සිදුවීම බලපෑමක් ඇති කළ නොහැකි වන සේ සහ අනාගතයේ දී මෙවැනි සිදුවීමක් ආගමික නායකයින් හෝ සාමාන්‍ය පුරවැසියන්ට සිදුවිය නොහැකි වන සේ සහනයක් ලබා දෙන ලෙසට ඉල්ලා ඇත.

**අගතියට පත් පාර්ශවකරු වන සුගතීෂ් සිවරාමක්‍රිෂ්නන් යන අයගේ ප්‍රකාශය**

අගතියට පත් පාර්ශවකරුගේ ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ ඔහුගේ පියා සෑම මසකම පූජාව සඳහා කතරගම යන බවත්, අදාළ සිද්ධිය සිදුවූ දිනද පියා කතරගම පූජාව අවසන් කර නැවා පැමිණීමෙන් අනතුරුව වාහනයේ තිබෙන බඩු භාණ්ඩ ආදිය රැගෙන යාම සඳහා පැමිණෙන ලෙසට දැන්වීමෙන් අනතුරුව එකී වාහනය නවත්වා තිබූ නිවසේ ප්‍රතිවිරුද්ධ දිසාවේ තිබෙන මහල් නිවාසය අසලට ගිය බවත් බඩු බාමින් සිටියදී එම මාර්ගය හරහා වාහන රැසක් ගමන් කරමින් සිටි බවයි. එම අවස්ථාවේදී වැරදි දිසාවට ගමන් කරන ලද ත්‍රීරෝද රථයකින් පැමිණෙන ලද සාමාන්‍ය ඇඳුමෙන් සිටි පුද්ගලයෙකු විසින් පියා දෙස බලා මාර්ගය අවහිර වන සේ වාහනය නවත්වා ඇති බවත් එකී වාහනය පාරෙන් ඉවත් කර ගන්නා ලෙසට කියා සිටි බවත් අහිතයෙන් ද සිංහල වචනවලින් ද පරුෂ වචන වලින් බැණ වැදුනු බවත් සඳහන් කර ඇත. එකී ත්‍රීරෝද රථයේ රියදුරු අසුනේ දෙදෙනෙකු අසුන් ගතවෙලා ගමන් කළ බවත් කෙසේ නමුත් ඔවුන්ගේ වාහනය නිසා කිසිදු අවහිරතාවයක් නොතිබූ බවටත් ප්‍රකාශ කර ඇත. තවද එම පුද්ගලයින් විසින් එසේ ප්‍රකාශ කිරීමෙන් අනතුරුව එම පුද්ගලයා විසින් .තම පියාට අසභ්‍ය වචන වලින් බැණ වැදුනු බැවින් ත්‍රීරෝද

රථයට ළඟාවී ඔවුන් බැණ වැදුනේ හින්දු ආගමික පූජකවරයෙකුට බවටත් ඔවුන් බෞද්ධ පූජකවරයෙකුට මේ විදියට පවසනවාද යනුවෙන් අසා සිටි බවටත් සඳහන් කර ඇත. පසුව රියදුරු අසුනේ සිටි පුද්ගලයෙකු පැමිණ ඔහුගේ කොළරයෙන් අල්ලා ගෙන ඔවුන් පොලිස් නිලධාරීන් බවට පැවසීමෙන් අනතුරුව ඔවුන් පොලිස් නිලධාරීන් බවට දැනගත් විගස ඔහුගේ අත ඉවත් කර ගත් බවත් සමාව ඉල්ලා සිටි බවත් සඳහන් කර ඇත. ඔවුන් පොලිස් නිලධාරීන් බවට කිසිදු හැඳුනුම්පතක් පෙන්වා නොසිටි බවත් මුල් අවස්ථාවේදීම එසේ දැනගත්තා නම් එම ආකාරයට හැසිරෙන්නේ නැති බවටද සඳහන් කර ඇත. එම මොහොතේ පටන් ඔවුන් තමාට පහර දුන් බවත් මාංචු දැමීමට උත්සාහ කළ නමුත් ඔහු ඒ සඳහා ඉඩ නොදුන් බවත් ඔහුව ඇද ත්‍රීරෝද රථයට තල්ලු කළ බවත් එසේ තල්ලු කරන ලද විදියට එදින ඔහුගේ අවසන් දින වේ යනුවෙන් ඔහුට සිතුනු බවටත් සඳහන් කර ඇත. ඔහුට ත්‍රීරෝද රථය තුළදී නිලධාරීන් කිහිප දෙනෙකු පහර දුන් බවත් පොලිස් ස්ථානයට යනතෙක් පහර දුන් බවත් පොලිස් ස්ථානයේදී ද කලුවර කාමරයකට රැගෙන ගොස් එක් නිලධාරියෙකු ඔහුගේ අතින් අල්ලා ගත් බවත් අනෙක් නිලධාරියෙකු විසින් පහර දුන් බවත්, එම නිලධාරියා විසින් ඔහුගේ ලිංගික ප්‍රදේශයට හා මුහුණට පහරදීමට තැත් කළ බවත්, ඔහුගේ නාසයෙන් ලේ එනතෙක් පහර දුන් බවත්, ඔහුගේ තොලද තුවාල වූ බවත්, එම අවස්ථාවේදී ඔවුන් ඔහුගේ ජාතිය අමතා " දෙමළ" " පකයා " යනුවෙන් පරුෂ වචන වලින් බැණ වැදුනු බවත් සිංහල වචන වලින් ද ඉගිපාමින් ද පරුෂ වචන වලින් බැණ වැදුනු බවත් සඳහන් කරයි. පසුව ස්ථානාධිපති විසින් ඔවුන් සියළු දෙනා කැඳවා විමසා සිටි බවත් එම අවස්ථාවේදී ඔහුගේ පියාද සිටින ලද බවත් ඔහුගේ නාසයෙන් ලේ එන බවට පෙන්වා සිටි නමුත් ස්ථානාධිපති විසින් එය නොසලකා හරින ලද බවත් මෙම සිදුවීම ස්ථානාධිපති විසින් සමථයකට පත් කිරීමට උත්සාහ කළ අවස්ථාවේදී මෙම සිදුවීම පොදු ස්ථානයක මහජනතාව ඉදිරිපිටදී, සිදුවූ සිදුවීමක් බැවින් එම ස්ථානයේදීම මෙම නිලධාරීන් විසින් සමාව ඉල්ලා සිටිය යුතු බවටත් ස්ථානාධිපති වෙත ප්‍රකාශ කළ බවට වැඩිදුරටත් සඳහන් කර ඇත. ඒ අනුව ඔවුන් සියළු දෙනාම අදාළ ස්ථානයට පැමිණ සමාව ඉල්ලා සිටි බවත් එක් නිලධාරියෙක් සමාව ඉල්ලීමකින් තොරව අත පමණක් අල්ලා ගිය බවත් මේ සම්බන්ධව පොලිස් අධිකාරී කාර්යාලයේදී ද විමර්ශනයක් පැවැත්වූ බවත් සඳහන් කර ඇත.

2024.01.20 දින සිදුවීමෙන් අනතුරුව එදිනම ඔහු ඩර්ඩන්ස් රෝහලෙන් ප්‍රතිකාර ලබා ගන්නා ලද බවත් අදාල වෛද්‍ය ටී. වීරසුදන් මහතා විසින් නිකුත් කරන ලද 2024.01.20 දිනැති Prescription මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කර සිටී. තවද එම වෛද්‍යවරයා විසින් ඔහුව විකිරණ පරීක්ෂණයක් සඳහා වෛද්‍ය එම්.එන්.ඩබ්.ජේ.වයි. සල්ගොඩ මහතා වෙත යොමු කළ බවත් එම වෛද්‍යවරයා විසින් නිකුත් කරන ලද 2024.01.23 දිනැති වාර්තාව ද කොමිෂන් සභාවට ඉදිරිපත් කළ බවට වැඩිදුරටත් සඳහන් කර සිටී.

මෙම සිදුවීම නිසා කම්පනයට පත්වූ අතර සිය දිවි හානි කර ගැනීමට තරම් සිතුවිලි ඇතිවූ බව සඳහන් කර ඇති අතර මේ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා සහනයක් ලබා දෙන ලෙසට ඉල්ලා ඇත.

**වගඋත්තරකරුගේ ප්‍රකාශය**

**සුහාෂ් මංජුල කහඳවල, ස්ථානාධිපති, පොලිස් ස්ථානය, වැල්ලවත්ත යන අයගේ ප්‍රකාශය**

2024.01.20 දින වැටලීම රාජකාරි සඳහා වැල්ලවත්ත පොලිස් ස්ථානයට අනුයුක්ත උ.පො.ප. උදයකුමාර, උ.පො.ප. තෙවරප්පෙරුම, පො.කො. 93968 සමරතුංග, පො.කො. 52353 සමරවීර යන නිලධාරීන් ABV-1656 පොලිස් ත්‍රීරෝද රථයෙන් සහ පො.කො. 84947 ගයාන් නිලධාරියා පුද්ගලික යතුරු පැදියෙන් ද සිවිල් ඇඳුමෙන් සැරසී පිටවූ බවත් හැමිල්ටන් මාර්ගය ප්‍රදේශයේ දී අත්අඩංගුවට ගන්නා ලද විෂ මත්ද්‍රව්‍ය ළඟ තබාගැනීමේ චෝදනාව මත විජේසූරිය ආරච්චිගේ අසේල සංජීව යන සැකකරු කලහකාරීව හැසිරී ඇති බැවින් ඔහුව කඩිනමින් පොලිස් ස්ථානය වෙත රැගෙන ඒම සඳහා කෙටි මාර්ගයක් භාවිතා කිරීමේ අරමුණෙන් එක් දිශාවට පමණක් ගමන් කළහැකි ඝසල්ස් පටුමග භාවිතා කර ඇති බවත් සඳහන් කර ඇත. එක් දිශාවට පමණක් ගමන් කළ හැකි එම

මාර්ගයේ එසේ විරුද්ධ දිශාවට ගමන් කරන අවස්ථාවේ ඉදිරියට පැමිණි කාර් රථයේ සිටි එස්. ශිවරාමක්‍රිෂ්නන් යන අය පොලීසිය සමග ආරවුලක් ඇති කරගෙන ඇති අතර පසුව ඔවුන්ව අදාළ පොලිස් නිලධාරීන් සමග පොලිස් ස්ථානයට කැඳවා කරුණු විමසා බලා ඉහත සඳහන් පරිදි මාර්ගයේ තහනම් දිශාවට ගමන් කිරීමට හේතු වූ කාරණාව අදාළ පාර්ශවයින්ට අවබෝධ කර දී පැමිණිලිකරු සහ පුතා ද ඉහත වැටලීමට ගිය නිලධාරීන් ද අතට අත දී සමථයකට පත්ව තිබූ බවත් මේ සම්බන්ධයෙන් සෑහීමට පත් නොවන්නේ නම් පොලිස් නිලධාරීන්ට විරුද්ධව පැමිණිලි කිරීමේ හැකියාව ඇති බවට එම අයට පහදා දුන් නමුත්, එස්. ශිවරාමක්‍රිෂ්නන් විසින් කිසිදු පොලිස් පැමිණිල්ලක් කර නොමැති බවත් සඳහන් කර ඇත.

තවද, එම අවස්ථාවේදී පැමිණිලිකරුගේ හිතවත් උතුරු පළාතේ සේවය කරන ලද හිටපු ආණ්ඩුකාරවරයෙක් ද ස්ථානාධිපතිගේ ජංගම දුරකථනයට අවස්ථා කිහිපයක දී ඇමතුම් ලබා දී සිද්ධිය සම්බන්ධව විමසා සිටි බවත්, මෙම සිද්ධියට අදාළ වීඩියෝවක් සමාජ මාධ්‍ය හරහා සැරිසැරීම හේතු කොට ගෙන පොලිස් අධිකාරී කාර්යාලයෙන් ද විමර්ශනයක් ආරම්භ කර දෙපාර්ශවය සමථයට පත් කර ඇති බවත් සඳහන් කර ඇත.

මෙම සිදුවීම සිදුවූ අවස්ථාවේ දී සිටි ඉෂාන් උදය කුමාර, උප පොලිස් පරීක්ෂක යන නිලධාරියාගේ ප්‍රකාශය අනුව, ෆසල්ස් පටුමග හරහා පොලිස් ස්ථානයට පැමිණෙන අවස්ථාවේ දී සාමිතුමාගේ නිවස අසල කැබ් රථයක් නවතා තිබූ බවත්, එම වාහනය මාර්ගය අවහිර වන සේ තිබූ බැවින් එම කැබ් රථය අසල සිටි තරුණයා වෙත එකී කැබ් රථය මදක් ඉවත් කර ගන්නා ලෙස පො.කො. 84947 ගයාන් නිලධාරියා විසින් ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. තවද, ඔහුව හඳුනා ගැනීම සඳහා හැඳුනුම්පත් ඉල්ලා සිටි නමුත් ඔහු විරෝධය පල කර කලහකාරී ලෙස හැසිරුණු බැවින් අදාළ පොලිස් කණ්ඩායම ඒ හා සමාන බලයක් යොදා එම පුද්ගලයාව ත්‍රීරෝද රථයට නංවාගෙන පොලිස් ස්ථානයට රැගෙන යන ලද බවත් සඳහන් කර ඇත. ඉන් පසුව ස්ථානාධිපතිතුමා නිලධාරී කණ්ඩායම කාර්යාලයට කැඳවූ බවත් එම අවස්ථාවේ දී සාමිතුමා ද ඔහුගේ පුතා ද සිටි බවත් ඒ සම්බන්ධයෙන් විමසීමක් කිරීමෙන් අනතුරුව සමථයට පත් කළ බවත්, වැඩිදුරටත් සඳහන් කර ඇත.

## උප පොලිස් පරීක්ෂක එතුල් අවිෂ්ක තෙවරප්පෙරුම යන නිලධාරියාගේ ප්‍රකාශය

මෙම සිදුවීමට අදාළ දිනයේදී දූෂණ රාජකාරියේ යෙදී සිටි බවත් හැම්සන් පාරේදී සැකකරුවෙක් අත්අඩංගුවට ගන්නා ලද බවත් එම අවස්ථාවේදී ඔවුන් (පොලිස් නිලධාරීන්) ගමන් කළේ ත්‍රීරෝද රථයක් වන බැවින් අත්අඩංගුවට ගන්නා ලද සැකකරු දැගලූ නිසා ෆසල්ස් පාර හරහා ත්‍රීරෝද රථයෙන් ගමන් කරමින් සිටියදී එම පාර අවහිර වී තිබුණු බවට සඳහන් කර ඇත. ඒ අනුව එම නිලධාරී කණ්ඩායමේ සිටි ගයාන් නිලධාරියා විසින් පාර අවහිර වන සේ නවතා තිබූ වාහනය අයින් කර ගන්නා ලෙස එතන සිටි පිරිමි ළමයෙක් වෙත ප්‍රකාශ කළ බවත් එම පුද්ගලයා පැමිණ රියදුරු සීට් එකේ අසුන් ගතව සිටි ගයාන් නිලධාරියාගේ බෙල්ලෙන් අල්ලා ගැනීමට උත්සාහ දැරූ බැවින් එම පුද්ගලයා සමග ගයාන් නිලධාරියා ත්‍රීරෝද රථයෙන් බැස පොර බැදූ බවට සඳහන් කර ඇත. එම අවස්ථාවේදී තමන් ත්‍රීරෝද රථයේ අත්අඩංගුවට ගන්නා ලද සැකකරු සමග සිටි බවත් ඔහු එළියට බැස නොමැති බවත් සඳහන් කර ඇත. පසුව උදය කුමාර නිලධාරියා ත්‍රීරෝද රථයෙන් බැස ස්වාමිතුමා සමග කථා කළ බවත් පසුව ගයාන් සහ සමරතුංග යන නිලධාරීන් කලහකාරී ලෙස හැසිරුනු එකී පුද්ගලයාව ත්‍රීවීල් රථයට දමාගෙන පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත් ප්‍රකාශ කර ඇත. වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ පොලිස් ස්ථානයට රැගෙන යාමෙන් අනතුරුව එකී පුද්ගලයා ස්වාමිගේ පුතා බවට දැනගන්නට ලැබුණු බවත් පසුව ස්ථානාධිපති පොලිස් නිලධාරීන් සිව් දෙනා සමග ස්වාමි සහ පුතාව කැඳවා දෙපාර්ශවයටම සමථයට පත්වන ලෙස යෝජනා කර ඇති බවත් ඒ අනුව පොලිස් නිලධාරීන් ස්වාමිගේ නිවස අසලට ගොස් සමාව ගෙන ඇති බවත් ඉන් දින 3 කට පසුව මෙම සිදුවීම සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වීම හේතුවෙන් අප නිලධාරීන් සිව් දෙනා සමග සාමිතුමා සහ ඔහුගේ පුතාවද පොලිස් අධිකාරී කාර්යාලයට

නවත්වා තිබීම හේතුවෙන්, පැමිණිලිකරුට එකී වාහනය මාර්ගයෙන් ඉවතට ගන්නා ලෙසට කියා සිටි බවයි.

පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද ඉහත කී වීඩියෝ සාක්ෂි අනුව නිරීක්ෂණය වන්නේ එම අවස්ථාවේදී පැමිණිලිකරු විසින් නවත්වා තිබූ වාහනය අසල පැමිණිලිකරු සමග පැමිණිලිකරුගේ පුතා ද රැඳී සිට ඇති බවටත් එකී මාර්ගයේ දෙපසටම වාහන ගමන් කරන ලද බවත් පැමිණිලිකරුගේ වාහනය එකී පාරේ අයිනට වන්නට නවත්වා තිබුණු නමුත් එකී මාර්ගයේ අවහිරයක් පැවතුනු බවයි. නමුත් සුහාජ් කහදවල, ස්ථානාධිපති, වැල්ලවත්ත පොලිසිය මහතාගේ ප්‍රකාශය අනුව ඉහත සඳහන් ෆසල්ස් පාර එක් දිසාවට පමණක් ගමන් කළ හැකි මාර්ගයක් බවත් ඒ අනුව පැමිණිලිකරු නිවැරදි දිසාවට ගමන් කර වාහනය නවත්වා ඇති බවත් වැරදි දිසාවට ගමන් කර ඇත්තේ පොලිස් ත්‍රිරෝද රථය බවත් නිරීක්ෂණය වේ. ඒ අනුව එකී මාර්ගයේ අවහිරතාවයක් ඇතිවීමට හේතුව ලෙස නිරීක්ෂනය වන්නේ පැමිණිලිකරුගේ වාහනය නවත්වා තිබීම තුලින් නොවන නමුත් වැරදි දිසාවට ගමන් කරන ලද පොලිස් ත්‍රිරෝද රථය හේතුවෙන් බවයි.

තවද, පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති වීඩියෝ සාක්ෂි අනුව මෙම වගඋත්තරකරුවන් ගමන් කළ ත්‍රිරෝධ රථය එම මාර්ගයේ ගමන් කරන අවස්ථාවේ දී වගඋත්තරකරු විසින් සඳහන් කර සිටින මෙම පැමිණිල්ලේ අගතියට පත් පාර්ශවකරු වන සුගතීෂ් සිවරාමක්‍රිෂ්නන් යන පුද්ගලයා සුදු පාට කැබ් රථය අසල සිටි බවටත්, එකී කැබ් රථය, පාර අවහිර නොවන පරිදි අයිනට වන්නට නවත්වා තිබූ බවටත් වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් විසින් සඳහන් කරන ආකාරයට පැමිණිලිකරුගේ පුතා ගයාන් යන නිලධාරියාගේ ටී-ෂර්ට් කොළරයෙන් අල්ලා එළියට ඇද ගැනීමක් හෝ පසුව එකී නිලධාරියාට මුලින්ම පහර දුන් බවට හෝ එය හේතු කොට ගෙන පොර බැදීමක් සිදුවූ බවට හෝ එම නිලධාරියාගේ ආත්මාරක්ෂාව සඳහා පොර බැදනු බවට හෝ එකී CCTV වීඩියෝ සාක්ෂි මගින් තහවුරු කර ගැනීමට හැකියාවක් නොමැත. පැමිණිලිකරු ඔහුගේ පැමිණිල්ලේ සඳහන් කාරණය තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති එකී වීඩියෝ සාක්ෂි වැඩිදුරටත් සලකා බැලීමේ දී පැමිණිලිකරු, පැමිණිලිකරුගේ පුතා සහ වගඋත්තරකාර නිලධාරීන් අතර හුවමාරු වූ බවට කියා සිටින අසභ්‍ය හෝ අගෞරව වන පරිදි එම අවස්ථාවේදී භාවිතා කළා යැයි කියනු ලබන වචන සම්බන්ධයෙන් පැහැදිලි නිරීක්ෂණයක් සඳහා එළැඹීමට එම වීඩියෝ සාක්ෂි ප්‍රමාණවත් නොවන බවට නිරීක්ෂණය වේ.

මේ සම්බන්ධව අගතියට පත්වූ පුද්ගලයාගේ ප්‍රකාශය අනුව, එකී ත්‍රිරෝද රථයේදී ඔහුව පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය එම කාලය තුළදී එක් නිලධාරියෙකුට වඩා වැඩි නිලධාරීන් කිහිප දෙනෙකු විසින් පහරදීමට ලක්වූ බවත් පොලිස් ස්ථානයේදී ද කළුවර කාමරයකට රැගෙන ගොස් නාසයෙන් හා තොලෙන් ලේ එනතෙක් පහර දුන් බවත් ඉන් අනතුරුව එදිනම ඔහු ඩර්ඩන්ස් රෝහලෙන් ප්‍රතිකාර ලබා ගත්තා ලද බවත් සඳහන් කර ඇත. අදාල වෛද්‍ය ටී. වීරසුදන් මහතාගෙන් 2024.01.20 දිනැති Prescription (රෝග නිශ්චය තුණ්ඩුව) මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත. එකී Prescription හි සඳහන් විස්තර සලකා බැලීමේදී පොලිස් නිලධාරීන් විසින් පහර දුන් බවට හා නාසයෙන් ලේ එන බවට සටහන් වී ඇති බවත් නිරීක්ෂණය වන අතර ඉහත කී Prescription හි සඳහන් දිනය හා පැමිණිල්ලේ සඳහන් සිදුවීම සිදු වී ඇති දිනය ද එකම දිනය බවට ද නිරීක්ෂණය වේ.

ඉහත සඳහන් කරුණු සලකා බැලීමේදී මෙම සිදුවීමෙන් අනතුරුව පැමිණිලිකරු විසින් ඔහුගේ පුතාව ප්‍රතිකාර සඳහා පුද්ගලික වෛද්‍යවරයෙකු වෙත යොමු කර ඇති බවත් අධිකරණ වෛද්‍යවරයෙකු වෙත යොමු කිරීමට අපොහොසත් වී ඇති බවත් නිරීක්ෂණය වන බැවින් වගඋත්තරකරුවන්ගේ ඉහත ක්‍රියාකලාපය හේතු කොට ගෙන පැමිණිලිකරුගේ පුත්‍රයාට ඇතිවූ ශාරීරික හිංසනයේ ප්‍රමාණය නිශ්චිතව තහවුරු කර ගැනීමට හෝ ඒ පිළිබඳව නිගමනයකට එළඹීමට හෝ හැකියාවක් නොමැත. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව යටතේ

තහවුරු කර ඇත්තේ කිසිම තැනැත්තෙකු වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවයි. නමුත් ඉහත සඳහන් කරුණු සළකා බැලීමේදී විශේෂයෙන්ම ඉහත සඳහන් අංක 6 සහ 7 යටතේ සඳහන් කර ඇති නිරීක්ෂණයන් වන

06 එම නිලධාරීන් තිදෙනාගෙන් දෙදෙනෙකු විසින් අගතියට පත් පාර්ශවකරුව ගේට්ටුවෙන් එළියට ඇදගෙන පැමිණෙන බවත් ඔහුගේ බෙල්ලෙන් අල්ලා ඇදගෙන ත්‍රිරෝද රථය තුළට තල්ලු කර නංවා ගත් බව.

07 පසුව රියදුරු සීට් එකේ අසුන් ගත් කලු පැහැති ටී-ෂර්ට් ඇඳ ගත් නිලධාරියා විසින් අගතියට පත් පාර්ශවකරුට අතින් පහර දෙන බව සහ තවත් නිලධාරියෙකු විසින් එය නවත්වන බව.

යන කරුණු සළකා බැලීමේදී සහ වගඋත්තරකරු විසින් පොලිස් ත්‍රිරෝද රථයකින් වගඋත්තරකාර නිලධාරීන් සිව් දෙනා සමග එක සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පසුව ඉහත සඳහන් සිදුවීමෙන් අනතුරුව පැමිණිලිකරුගේ පුතා වන සුගදීශ් ශිවරාමක්‍රිෂ්නන් යන අයවද එකී පොලිස් ත්‍රිරෝද රථයෙන්ම පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් ඇත. ඒ අනුව සාමාන්‍යයෙන් රියදුරෙකු සමග ත්‍රිරෝද රථයක පිටුපස අසුනේ ගමන් කිරීමට හැකියාව ඇත්තේ තිදෙනෙකු වන නමුත් ඉහත කී අවස්ථාවේදී පුද්ගලයින් 6 දෙනෙකු ගමන් කර ඇති බවට නිරීක්ෂණය වීම තුළින් මත්ද්‍රව්‍ය සඳහා අත්අඩංගුවට ගෙන ත්‍රිරෝද රථය තුළ සිටි සැකකරු මෙන්ම මෙම පැමිණිල්ලේ පැමිණිලිකරුගේ පුත්‍රයා ද එනම් අගතියට පත් පාර්ශවකරු ද අමානුෂික ලෙස සැළකීමට ලක් කර ඇති බවට පැහැදිලිව නිරීක්ෂණ වේ.

ඒ අනුව පැමිණිලිකරුගේ පුතා වන සුගතීෂ් සිවරාමක්‍රිෂ්නන් යන අයට අමානුෂික හා අවමන් සහගත ලෙස සළකා ඇති බවට නිරීක්ෂණය වන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 ව්‍යවස්ථාව උල්ලංඝණය වී ඇති බවට නිරීක්ෂණය වේ.

පැමිණිල්ලේ සඳහන් කරුණු හා වගඋත්තරකරුගේ ප්‍රකාශය අනුව අගතියට පත් තැනැත්තාව අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට රැගෙන ගොස් ඇති බවට නිරීක්ෂණය වන නමුත් අත්අඩංගුවට ගැනීම සම්බන්ධව වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ සළකා බැලීමේදී උ.පො.ප. එනුල් අවිෂ්ක තෙවරප්පෙරුම මහතා විසින් සඳහන් කර තිබෙන්නේ පාර අවහිර වන සේ නවතා තිබූ වාහනය ඉවත් කර ගන්නා ලෙසට දැනුම් දීමෙන් පසුව එහි සිටි පිරිමි ළමයා රියදුරු සීට් එකේ සිටි ගයාන් නිලධාරියාගේ බෙල්ලෙන් අල්ලා ගැනීමට උත්සාහ කළ බවත්, පසුව එම දෙදෙනා පොර බැදුනු බවත්, කලහකාරී ලෙස හැසිරුනු එම පුද්ගලයාව ගයාන් සහ සමරතුංග යන නිලධාරීන් දෙදෙනා විසින් ත්‍රිරෝද රථයට දමාගෙන පොලීසියට රැගෙන ගිය බවට සඳහන් කර ඇත.

පො.කො. එස්.ජ්.ආර්.එස්. සමරතුංග විසින් සඳහන් කර ඇත්තේ, එම පුද්ගලයා විසින් ගයාන් නිලධාරියාගේ කොලර් එකෙන් ඇද එළියට ගන්නා ලද බවත් දෙදෙනාම පොර බැදුනු බවත්, පසුව පොලිස් ස්ථානයට රැගෙන ගිය බවටත් සඳහන් කර ඇත. පො.කො. ඩබ්.එම්. ගයාන් හේරත් වන්නිනායක යන නිලධාරියා විසින් සඳහන් කර ඇත්තේ වාහනය ඉවත් කර ගන්නා ලෙස දැනුම්දීමෙන් පසුව එම ස්ථානයේ රැඳී සිටින ලද පුද්ගලයා පැමිණ ඔහුගේ ටී-ෂර්ට් එකෙන් ඇද ඔහුව එළියට ඇද ගත් බවත් ඔහු සමග බොහෝ වේලාවක් පොර බැදුනු බවත් ඔහු සමග සිටි අනෙකුත් නිලධාරීන් පැමිණ ඔහුව බේරා ගත් බවත් ඔවුන් කලහකාරී ලෙස හැසිරුනු සැකකරුවෙකු පොලිස් ස්ථානය වෙත රැගෙන යන අවස්ථාවේ දී එනම් රාජකාරි ගමනක සිටියදී සාමිගේ පුතා විසින් රාජකාරියට බාධා කිරීම හේතුවෙන් ඔහුව ද පොලිස් ස්ථානයට රැගෙන යාමට සිදු වූ බවයි.

උ.පො.ප. ඉෂාන් උදය කුමාර යන නිලධාරියා විසින් සඳහන් කර ඇත්තේ අදාළ කැබ් රථය මඳක් ඉවත් කර ගන්නා ලෙස ගයාන් නිලධාරියා විසින් දැනුම් දුන් බවත්, ඔහුව හඳුනා ගැනීම සඳහා ජාතික හැඳුනුම්පත් ඉල්ලා සිටි නමුත්, ඔහු විරෝධය පල කරමින් කලහකාරී ලෙස හැසිරුනු බැවින්, පොලිස් නිලධාරීන් ඒ හා සමාන බලයක් යොදා එම පුද්ගලයාව ත්‍රිරෝධ රථයට නංවාගෙන පොලිස් ස්ථානයට රැගෙන ගිය බවයි.

ඉහත වගඋත්තරකරුවන් සිව් දෙනාගේ ප්‍රකාශයන් අනුව පැමිණිලිකරුගේ කැබ් රථය ඉවත් කර ගන්නා ලෙසට ගයාන් යන නිලධාරියා විසින් දැනුම් දී ඇති බවට පැහැදිලිව නිරීක්ෂණය වේ. නමුත් එක් වගඋත්තරකරුවෙකු විසින් සදහන් කර ඇත්තේ හදුනාගැනීම සදහා ජාතික හැදුනුම්පත ඉල්ලා සිටි නමුත් ඔහු විරෝධය පල කර කලහකාරී ලෙස හැසිරුනු බැවින් අත්අඩංගුවට ගත් බවත්, අගතියට පත් පාර්ශවකරු සමග පොර බැදුනු නිලධාරියාගේ ප්‍රකාශයේ එවැනි හේතුවක් සදහන් කර නොමැති අතර, රාජකාරියට බාධා කිරීම මත අත්අඩංගුවට ගත් බවත්, අනෙකුත් නිලධාරීන් දෙදෙනා විසින් සදහන් කර ඇත්තේ පොර බැදුනු නිලධාරියාගේ කොළරයෙන්, බෙල්ලෙන් අල්ලා එළියට ඇද ගත් බවත්, කළහකාරී ලෙස හැසිරුණු බවත්, ඒ හේතුව මත අත්අඩංගුවට ගත් බවටත් ස්ථානාධිපති විසින් සදහන් කර ඇත්තේ ස්වාමිතුමා සමග ආරවුලක් ඇති කරගෙන ඇති බවටත් යන්න සදහන් කිරීම තුලින්, මෙම පුද්ගලයාව අත්අඩංගුවට ගන්නා ලද හේතුව නිශ්චිත නොමැති බවට ද නිරීක්ෂණය වේ.

ඒ අනුව, ඉහත කී පැමිණිලිකරුගේ පුතාව අත්අඩංගුවට ගෙන ඇත්තේ නිසි හේතුවක් ඔහුට නොදන්වා බවට පැහැදිලිව නිරීක්ෂණය වීම තුලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) වගන්තියේ සද.හන් පරිදි අත්අඩංගුවට ගැනීම සදහා නිසි හේතුවක් දැනුම් දිය යුතුය යන අයිතිය ද උල්ලංඝණය වී ඇති බවට ද නිරීක්ෂණය වේ.

තවද අත්අඩංගුවට ගැනීමට අදාළව ඉෂාන් උදය කුමාර විසින් මෙම කොමිෂන් සභාව ඉදිරිපිටදී ප්‍රකාශ කර ඇත්තේ ෆසල්ස් පටුමග හරහා පොලිස් ස්ථානයට පැමිණෙන අවස්ථාවේ දී සාමිතුමාගේ නිවස අසල කැබ් රථයක් නවතා තිබූ බවත්, එම වාහනය මාර්ගය අවහිර වන සේ තිබූ බැවින් එම කැබ් රථය අසල සිටි තරුණයා වෙත එකී කැබ් රථය මදක් ඉවත් කර ගන්නා ලෙස පො.කො. 84947 ගයාන් නිලධාරියා විසින් ප්‍රකාශ කළ බවයි. නමුත් මෙම කොමිෂන් සභාව වෙත වගඋත්තරකරු විසින් ඉදිරිපත් කර ඇති උද්ධෘත වාර්තාවේ පිටුව 105 ඡේදය 168 දිනය 2024.01.25 සටහන් ඇලවීම යන ශීර්ෂය යටතේ සදහන් කර ඇති කරුණු වල සටහන් කර ඇත්තේ කැබ් රථය අසල රැදී සිටි පුද්ගලයාගේ හැසිරීම සැකසහිත බැවින් ඔහු පොලිස් නිලධාරියෙකු බවට පවසා එකී පුද්ගලයාව හදුනා ගැනීම සදහා ජාතික හැදුනුම්පත ඉල්ලා සිටි බවත්, එම අවස්ථාවේදී එකී පුද්ගලයා එයට විරෝධය පාමින් ආවේගශීලී ලෙස පිළිතුරු දුන් බවයි. ඒ අනුව පැමිණිලිකරුගේ නවත්වා තිබුණු වාහනය හේතුවෙන් මාර්ගයේ අවහිරයක් පැවතුණු බවට හෝ ඒ නිසා වාහනය ඉවත් කර ගන්නා ලෙසට දැනුම් දුන් බවට හෝ කිසිදු සදහනක් එකී උද්ධෘත වාර්තාවේ සදහන් නොවන බවට පැහැදිලි ලෙස නිරීක්ෂණය වේ.

තවද එම නිලධාරියාගේ පැමිණීමේ සටහන් වල පිටු 24 ඡේද 123 හි සදහන් වන්නේ ෆසල්ස් පාරේ ඔහු හට ලද තොරතුරකට අනුව පරීක්ෂා කිරීමට ඔහු අනෙකුත් නිලධාරීන් ද සමග සංචාරය කළ බවත් සංචාරයේදී ඔවුන් ඉදිරියට පුද්ගලයෙකු පැමිණි අතර, ඔහුව හදුනා ගැනීම සදහා ජාතික හැදුනුම්පත ඉල්ලා සිටි බවත් එම පුද්ගලයා විරෝධය පැමත් සමග බහින්බස්වීමක් හා නොසන්සුන්කාරී තත්වයක් ඇති වූ බවත් සදහන් කර ඇත. ඒ අනුව එකම නිලධාරියා විසින් අවස්ථා තුනකදීම ඉදිරිපත් කර ඇති හේතුන් අතර පරස්පරතාවයක් තිබෙන බවට මනාව පැහැදිලි වේ.

තවද, පොලිස් කොස්තාපල් සමරතුංග ආරච්චිලාගේ රශ්මික ශෙහාර සමරතුංග යන අයගේ ප්‍රකාශයේ සදහන් වන්නේ, කුඩුවලට අත්අඩංගුවට ගන්නා සැකකරුවෙකු රැගෙන පැමිණිලිකරු පදිංචි නිවස පිහිටා ඇති මාර්ගය ඔස්සේ ගමන් කරමින් සිටියදී කැබ් එකක් පාරේ මැදට වෙන්න නවතා තිබීම නිසා ඔවුන්ට ගමන් කිරීමට ඉඩ මදි බවත් පාර අවහිර ව තිබුණු බවත් එකී වාහනය පොඩ්ඩක් ගන්න කියා ගයාන් නිලධාරියා විසින් පැවසීමෙන් අනතුරුව, එහි සිටි පිරිමි ළමයෙක් පැමිණ ගයාන් නිලධාරියාගේ කොලර් එකෙන් අල්ලා ඔහුව එළියට ඇදලා ගත් බවයි. කිසිම අවස්ථාවක එම පිරිමි ළමයාව හදුනා ගැනීම සදහා හැදුනුම්පත් ඉල්ලා සිටි බවට හෝ එකී ඉල්ලීමට එම පුද්ගලයා විරෝධයපැමක් සිදුකළ බවට හෝ මෙම සමරතුංග නිලධාරියා විසින් සදහන් කර නොමැත. ඒ අනුව, ඉහත සදහන් කළ පරිදිම වගඋත්තරකරු විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති උද්ධෘත වල සදහන් කර ඇති පරිදි, එම පිරිමි පුද්ගලයාගෙන් හැදුනුම්පත් ඉල්ලා සිටි බවට මෙම නිලධාරියා විසින ද ඔහුගේ ප්‍රකාශවල සදහන් කර නොමැති බවට නිරීක්ෂණය

වීම තුලින් මෙම කොමිෂන් සභාව ඉදිරියේ දී ලබා දී ඇති ප්‍රකාශය සහ එකී උද්‍ධෘත වාර්තා අතර පරස්පරතාවයක් තිබෙන බවට පැහැදිලි වේ.

තවද, ඉහත කී උද්‍ධෘත වාර්තාවේ ඉෂාන් උදය කුමාර යන නිලධාරියා විසින් 2024.01.25 දිනැතිව පිටුව 105 ජේදය 168 හි සටහන් ඇලවීමේ සඳහන් කර ඇති පරිදි කැබ් රථය අසල රැඳී සිටිය පුද්ගලයෙකුගේ හැසිරීම සැක සහිත බැවින් ඔහු පොලිස් නිලධාරියෙකු බවට පවසා ඔහුව හඳුනා ගැනීමට ජාතික හැඳුනුම්පත ඉල්ලා සිටීමට කටයුතු කළ බවටයි.

නමුත් ඉහත වීඩියෝ සාක්ෂිය නිරීක්ෂණය කිරීමේදී වගඋත්තරකරු විසින් සඳහන් කරන ආකාරයට එම පුද්ගලයා එකී කැබ් රථය අසල රැඳී සිටීම සැක සහිත කටයුත්තක් නම්, ඔහු රැඳී සිටියේ කැබ් රථයක් අසල බැවින් එකී කැබ් රථය පරීක්ෂා කිරීමක් හෝ ඒ අසලම සිටි අනෙකුත් පුද්ගලයින්ව පරීක්ෂා කිරීමට හෝ ප්‍රශ්න කිරීමට එම නිලධාරීන්ට බලය මෙන්ම හැකියාවක්ද තිබුණු නමුත් එවැනි පියවරක් ගෙන නොමැති බවත් එම වගඋත්තරකරුවන් විසින් කැබ් රථය දිසාවට යාමක් සිදු කර නොමැති බවත් වීඩියෝ සාක්ෂි අනුව නිරීක්ෂණය වේ.

ඒ අනුව වගඋත්තරකරුවන් විසින් මෙම පැමිණිල්ලේ අගතියට පත්වූ පාර්ශවකරු ලෙස නම් කර ඇති සුගතීෂ් සිවරාමක්‍රිෂ්නන් යන අයව අත්අඩංගුවට ගැනීම සම්බන්ධව විවිධ හේතුන් ඉදිරිපත් කර ඇති බවත්, මාර්ගය අවහිර වන නිසා පැමිණිලිකරු විසින් නවතා තිබූ කැබ් රථය ඉවත් කර ගන්නා ලෙසට පැමිණිලිකරු වෙත දැනුම් දුන් බවට ඉහත 01 සිට 04 දක්වා වන වගඋත්තරකාර නිලධාරීන් විසින් මෙම කොමිෂන් සභාව ඉදිරිපිටදී ප්‍රකාශ කර ඇති අතර අගතියට පත් පාර්ශවකරු විසින්ද සඳහන් කර ඇත්තේ එම නිලධාරීන් විසින් වාහනය ඉවත් කර ගන්නා ලෙසට පැවසූ බවයි. ඒ අනුව නියත වශයෙන්ම වගඋත්තරකරුවන් විසින් එම අවස්ථාවේදී පැමිණිලිකරු වෙත පවසා ඇත්තේ පාර අවහිර වන නිසා කැබ් රථය ඉවත් කර ගන්නා ලෙසට බව තහවුරු වේ. නමුත් ඔවුන් විසින් මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති උද්‍ධෘත වාර්තාවේ එවැනි කරුණක් සඳහන් නොවන බවට නිරීක්ෂණය වීම තුලින් එකී උද්‍ධෘත වාර්තවේ සත්‍ය තොරතුරු ඇතුලත් කර නොමැති බවට තවදුරටත් නිරීක්ෂණය වේ.

පුරවැසියන්ගේ ආරක්ෂාව උදෙසා ශ්‍රී ලංකා පොලීසියට අනුයුක්තව සේවය කරනු ලබන නිලධාරීන් විසින්ම පුරවැසියෙකුගේ ආරක්ෂාවට බලපෑමක් සිදු වීම යන කාරණය කිසිසේත්ම පිළිගත නොහැකි කරුණක් වේ. තවද, මෙවැනි ක්‍රියාවන් හේතුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණය ද, සර්ව සාධාරණ විය යුත්තේ ය යන අයිතිය ඉහත සඳහන් නිරීක්ෂණ අනුව මෙම 2, 3 සහ 4 වගඋත්තරකරුවන් විසින් උල්ලංඝණය කර ඇති බවට වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

මෙම කොමිෂන් සභාව ඉදිරිපිටදී සාක්ෂි ලබා දෙන ලද නිලධාරීන් සියලු දෙනා විසින් සඳහන් කර ඇත්තේ ඔවුන් විසින් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන එම සැකකරුව පොලිස් ස්ථානයට ඉදිරිපත් කිරීමට යන අවස්ථාවේදී මෙම පැමිණිල්ලට අදාළ සිදුවීම සිදුවූ බවයි. තවද 01 වන වගඋත්තරකරු වන උ.පො.ප. තෙවරප්පෙරුම මහතාගේ ප්‍රකාශය අනුව ඉහත කී සැකකරු එම අවස්ථාවේදී තමාගේ භාරයේ ත්‍රීරෝද රථය තුළ ඔහු සමග සිටි බවයි. තවද වීඩියෝ සාක්ෂි නිරීක්ෂණය කිරීමේදී ඉහත කී පොලිස් ත්‍රීරෝද රථයේ සිටි නිලධාරීන් තිදෙනෙකු පමණක් එළියට බැස යන බවයි. තවද අගතියට පත් පාර්ශවකරු විසින් සඳහන් කර ඇති පරිදි ත්‍රීරෝද රථය තුළදී එක් නිලධාරියෙකුට වඩා වැඩි නිලධාරීන් විසින් පහර දුන් බවට සඳහන් කර ඇති නමුත් එම නිලධාරීන් කවුරුන්ද යන්න හඳුනා ගෙන නොමැත. මෙම කාරණාවන් සළකා බැලීමේදී උප පොලිස් පරීක්ෂක තෙවරප්පෙරුම මහතා මෙම පැමිණිල්ලේ සඳහන් චෝදනාවට සම්බන්ධ බවට කරුණු අනාවරණය නොවේ.

තවද, වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශය අනුව මෙම සිද්ධිය සම්බන්ධයෙන් වැල්ලවත්ත පොලිස් ස්ථානාධිපති විසින් සහ බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී විසින් දෙපාර්ශවයම කැඳවා සමථයට පත්කල බවත් පැමිණිලිකරු විසින් මේ සම්බන්ධව වැඩිදුර විමසීම් / පියවරක් ගැනීමට අවශ්‍ය නොවන බවටත් ප්‍රකාශ කර ඇති බවට නිරීක්ෂණය වේ. කෙසේ නමුත් එසේ සමථයට

පත්වූවා යැයි කියන කාරණාව වගඋත්තරකාර නිලධාරීන් විසින් පැමිණිලිකරුගේ පුතාට අමානුෂික ලෙස සළකා ඇති ක්‍රියා කලාපය නිවැරදි නොකරනු ලැබේ. තවද, එකී කරුණ පැමිණිලිකරුගේ පුතාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී තිබේද නැද්ද යනුවෙන් සළකා බැලීමට බාධාවක් ද නොවේ.

**නිගමනය**

ඉහත සදහන් නිරීක්ෂණයන් අනුව වගඋත්තරකරුවන් විසින් අගතියට පත් පාර්ශවකරු අමානුෂික ලෙස සහ අවමන් සහගත ලෙස සළකා ඇති බැවින් ද අගතියට පත් පුද්ගලයාව අත්අඩංගුවට ගැනීමේදී නිසි හේතුවක් දැනුම් දී නොමැති බැවින්ද 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11, 12(1) සහ 13 (1) වන ව්‍යවස්ථාවන් මගින් සහතික කර ඇති මූලික අයිතිය උල්ලංඝණය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිගමනය කෙරේ.

**නිර්දේශය**

මෙම සිදුවීමට අදාලව පැමිණිලි පාර්ශවය සහ වගඋත්තරකාර පාර්ශවය සමථයකට පත්වී ඇතත් මේ පිළිබද මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ල විභාග කර නිර්දේශය ලබා දෙන ලෙසට පැමිණිලි පාර්ශවය අයදුම් කර ඇත. ඉදිරිපත් වී ඇති කරුණු සියල්ල සළකා බැලීමෙන් අනතුරුව

01 පැමිණිලි පාර්ශවය වගඋත්තරකරුවන් සමග සමථයට පත්ව ඇති බව අනාවරණය වන බැවින් වගඋත්තරකාර පාර්ශවයන් වෙතින් පැමිණිලිකාර පාර්ශවය වෙත වන්දි මුදලක් ගෙවීමට නිර්දේශ නොකරනු ලැබේ.

02 පැමිණිල්ලට අදාළ සියලු කරුණු සළකා බැලීමෙන් අනතුරුව 02, 03, 04 වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය පිළිබද සුදුසු විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙස පොලිස්පතිවරයා වෙත නිර්දේශ කරනු ලැබේ.

2025. 03 . 17 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමටට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර එදිනට පෙර අදාළ දැනුම් දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සළකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත : 01 අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
18 වන මහල, සුහුරුපාය,
බත්තරමුල්ල.

02 ලේකම්,
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
18 වන මහල, සුහුරුපාය,
බත්තරමුල්ල.

03 පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
යෝර්ක් වීදිය,
කොළඹ 02.

රේ/-